**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 12 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් හා බදු ආදායම රු.2,590,040 ක් වුවද ආදායම් වියදම් ගිණුම අනුව රු.2,322,613 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.267,427 ක් අඩුවෙන් ගිණුම් ගත වී තිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දැක්විය යුතු වේ. | ප්‍රා.ස 04 අනුව වර්ෂයේ වරිපනම් හා බදු ආදායම රු.2,322,613 කි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ පොදු වැසිකිලිය බදු කුලී බිල්කල ආදායම රු.570,000 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ රු.191,250 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.378,750 ක් අඩුවෙන් දක්වා තිබුණි | මුදල් වර්ෂයට අදාල ආදායම මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දැක්විය යුතු වේ. | සමාලෝචිත වර්ෂයේ රු.570,000 ක් වූ බිල් කළ ආදායම මාසිකව අය කර ගැනීමේදී ප්‍රා/ස 04 වාර්ථාවේ සිදුවී තිබුණු දෝෂයන් නිසා මෙම වෙනස ඇතිවී තිබුණි. මෙම වැරැද්ද මින් ඉදිරියට නොවීමට වග බලා ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් බදු කුලී හා සති පොළ බිල්කල ආදායම රු.703,230 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ රු.4,211,226 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.492,004 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දැක්විය යුතු වේ. | ප්‍රා/ස 04 ආදායම් ලේඛනයේ අය ශීර්ෂය මාරු වීමක් නිසා රු. 492004.00 ක් වෙනස අය ශීර්ෂ වල සටහන් නොකිරීම නිසා සිදු වු වැරැද්ද නිවැරදි කිරීම මත මෙම වෙනස ඇති වු බව කාරුණිකව දන්වමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර බදු ආදායම හඳුනාගෙන හෝ ඇස්තමේන්තු ගත කර ගිණුමට ගෙන නොතිබුණි. | වර්ෂයට අදාල මුද්දර බදු ආදායම හඳුනාගෙන හෝ ඇස්තමේන්තුගත කර මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දැක්විය යුතු වේ. | පිළිගනිමි.<br>**සමාලෝචිත වර්ෂයට අදාල ආදායම හඳුනා ගෙන ගිණුම් ගත කරමි.** |
| (v) | සමාලෝචිත වර්ෂයේ බිල්කළ වෙනත් ආදායම් රු.670,477<br>වුවද ආදායම් වියදම් ගිණුමේ රු.880,458 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු. 209,981 වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් වර්ෂයට අදාල ආදායම මූල්‍ය ප්රකාශන වල නිවැරදිව දැක්විය යුතු වේ. | ප්‍රා/ස 04 ලිවීමේදී අය ශීර්ෂය මාරු වීම නිසා මෙම වෙනස ඇති වී ඇත. ඉදිරියේදි ලැබෙන ආදායම් අදාල අය ශීර්ෂයේම ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ අයකර තිබුණු රු.202,585 ක මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු බැරකමක් ලෙස දක්වා නොතිබුණි. | බැරකම් හඳුනාගෙන නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතු වේ. | මෙම මුදල ආදායමට ගෙන නැවත ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට නිවැරදිව කාර්තු වශයෙන් ගෙවීම සිදුකර ඇත.මින් ඉදිරියට මෙම ගණුදෙනුව නිවැරදිව ගිණුම් ගත කරමි. |
| (vii) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය සඳහා වන සමාලෝචිත වර්ෂයේ ණය පොළිය රු.1,302,352 අදායම් වියදම් ගිණුමේ වියදමක් ලෙස දක්වා නොතිබුණි. | ණය වාරික ගෙවීම් සහ ඊට අදාල පොළී ගෙවීම් නිවැරදිව වෙන්කර හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. වර්ෂයට අදාල වාරික ගෙවිම් හා පොළි ගෙවීම් වෙන වෙනම හඳුනා ගෙන ගණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ සේවක විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික වියදම රු.48,444 අදායම් වියදම් ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික වියදම් වටිනාකම වන රු.1,356,742 ක් දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි. | මුදල් වර්ෂයට අදාල වියදම සහ ශේෂපත්‍ර දිනට බැරකම නිවැරදිව ගණනය කර දැක්විය යුතුය. | පළාත් පාලන විශ්‍රාම වැටුප්, විශ්‍රාම හා පාරිතෝෂික වියදම වියදමක් (ණය හිමියෙක් ලෙස) ලෙස ගිණුම් ගත කර හිග මුදල වාරික වශයෙන් ගෙවීමටත් මාසික වාරිකය නිසි පරිදි ගෙවීමටත් කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ix) | 2017 වර්ෂයේ ඉටුකර තිබුණු ව්‍යාපෘති 8 ක ගෙවීම් කර නොතිබුණු අතැති බිල් රු.2,447,475 ක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මුදල් වර්ෂයට අදාල වියදම් පමණක් ආදායම් වියදම් ගිණුමේ දැක්විය යුතු අතර පූර්ව වර්ෂ වලට අදාල වියදම් හඳුනාගෙන ගැළපුම්කල යුතු වේ. | පිළිගනිමි. 2017.12.31 දිනට මෙම ශේෂයන් ණය හිමියන් ලෙස හඳුනාගෙන නොමැති අතර සිදු වු වරද නිවැරදි කර ගනිමි. |
| (x) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩා ඉවත් කල පොදු වෙළඳපල කඩකාමර සඳහා තැන්පත් මුදල රු. 80,508 ක් හා පුර නැගුම වෙළඳ සංකීර්ණයේ කඩකාමර සඳහා තැන්පත් මුදල් රු.7,874,075 වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි. | ශේෂපත්‍ර දිනට සියළු බැරකම් නිවැරදිව ගණනයකර දැක්විය යුතු වේ. | පිළිගනිමි. නිවැරදි කර ගනිමි. |
| (xi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත අතරුඳවුම් රු.1,946,334 ක වටිනාකම වෙනත් තැන්පත් ලෙස දක්වා තිබියදී එම වටිනාකම කර්මාන්ත ණය හිමියන් ලෙස ද දක්වා තිබුණි. | බැරකම් දෙවරක් ගිණුම්වල දැක්වීම ගැලපුම් කර නිවැරදි කල යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදි වැරදි නිවැරදි කර ගනිමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 05 කට අදාල ලේඛන අනුව වටිනාකම රු.2,797,831 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල රු.12,149,762 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.9,351,931 ක එකතු වෙනසක් විය. | අදාලශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. අදාල ලේඛන වල හා මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් වල වෙනසක් ඇති වී ඇත්තේ ලේඛන වල අදාල තොරතුරු නිවැරදි ලෙස සටහන් නොකිරීම හා අතපසුවීම් මග හැරීම් තිබි ඇති බැවිනි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 02 ක අවසන් ගිණුමේ රු.28,681,424 ක් දක්වා තිබුණු අතර ඒවාට අදාල උපලේඛන අනුව ශේෂය රු.50,778,291 ක් වූයෙන් රු.22,293,149 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ | පිළිගනිමි.අවසන් ගිණුමේ දක්වා ඇති ශේෂයන් වලට අදාලව උප ලේඛන වල වෙනස්කම් නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (iii). 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දේශීය ණය අරමුදල් ශේෂය රු.13,166,875 වුවද ශේෂ පත්‍රයේ එය රු.11,711,648 ලෙස දක්වා තිබුණු බැවින් රු.1,455,227 ක වෙනසක් විය. | අදාල වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළයුතු වේ. | දේශීය ණය අර මුදලේ ශේෂ පත්‍රයට වඩා දේශීය ණය අර මුදල් ගිණුමේ ශේෂය වැඩි වී ඇත්තේ ණය වාරික මුදල සමග පොලී මුදල වෙන වෙනම ගිණුම් ගත නොකිරීම හේතුවෙනි.නැවත ගිණුම් සකස් කිරීමේදී එම වැරදි නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 5 ක් ඉක්මවා ඉදිරියට ගෙන එමින් තිබුණු රු.19,030,983 ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ පිළිබඳ තොරතුරු සොයමින් පවතින අතර ඉදිරි වර්ෂය වන විට මෙම ශේෂ නිරවුල් කර ගනිමි. |
| (ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 09 ක් ඉක්මවූ කාලයක සිට මූලා‍‍ ප්‍රකාශනවල පැවත එමින් පැවති රු.1,062,284 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 05 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳ තොරතුරු සොයමින් පවතින අතර හැකි විගස පළාත් පාලන කොමසාරිස්තුමිය මගින් අදාල විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කර උපදෙස් පරිදි ශේෂ නිරවුල් කර ගනිමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.168,008,715 ක් ගිණුම් විෂයයන් 12 කට අදාලව වත්කම් ලේඛන,හිමිකම් සහතික, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | 2019 වසරේ ගිණුම් සමඟ ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

---------------------------------------------------------------------

| | නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (i) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 203 අධිකාරිය | සභාව සතු ටැෆේ ට්‍රැක්ටරය සහ ජල බවුසරයක් ලියාපදිංචි කර නොතිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | වාහන ලියා පදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii) | 1987 අංක 10 දරණ ප්‍රාදේශීය සභා පනතේ 92 වගන්තිය හා 2008 අංක 13 දරන ගෝඝාතන (සංශෝධන) පනත- 272 අධිකාරියේ 18 වගන්තිය | මහ සියඹලාගස්කඩ හා මුස්ලිම් හල්මිල්ලෑව යන ප්‍රදේශවල පෞද්ගලික ස්ථානවල ගව ඝාතකාගාර 02 බලපත්‍ර රහිතව පවත්වාගෙන ගොස් තිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | මහසියඹලාගස්කඩ හා මුස්ලිම් හල්මිල්ලෑව ප්‍රදේශ වල ගව මස් වෙළඳසැල් 2018 වර්ෂයේදී ටෙන්ඩර් කර තිබුණි. |
| (iii) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය පරිපාලන ) රීති සංග්‍රහය<br>-------------------<br>රීති 217 හා 218 | සභාව සතු ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් P.S.46 ආකෘතිය ප්‍රකාර ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක්ම පරික්ෂාකර නොතිබුණි. | රීතිවලට අනුකූලව කටයුතු කළයුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ලේඛනයක් පවත්වා ගෙන යන අතර එම ඉඩම් හා ගොඩනැගිලි හැකි ඉක්මනින් තක්සේරු කර ලේඛන යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (iv) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>--------------------------<br>මු. රෙ 454(2) | සියළුම ගොඩනැගිලි විදුලි උපාංග පිළිබඳ ලේඛනයක් | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු | ගොඩනැගිලි සම්බන්ධ ලේඛනයක් පවත්වා ගෙන ගියද සියළු ගොඩනැගිලි |

| | | | | |
|---|---|---|---|---|
| | | පවත්වාගෙන ගොස් නොතිබුණි. | කළයුතු වේ. | තක්සේරු කර නොමැති නිසා යාවත් කාලීන කළ නොහැකිව ඇත. |
| (v) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------------------<br>2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 08 ක් සම්බන්ධව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි.වාහන සඳහා දැනටමත් ඉන්ධන පරීක්ෂා සිදු කිරීමට කටයුතු කරමි. |
| (vi) | රාජ්‍ය ප්‍රසම්පාදන කාර්යය සහ මාර්ගෝපදේශ සංග්‍රහය<br>----------------------------<br>2.1 වගන්තිය | ප්‍රාදේශීය සභාවේ පුස්තකාල පළමු මහල ඉදිකිරීමේ රු.5,105,608 ක ඇස්තමේන්තුවේ පුස්තකාලයේ පරිහරණය සඳහා භාවිතා කරන රු.1,550,950 ක් වූ ලීබඩු උපකරණ, ඇමතුම් පද්ධතිය සහ තීර රෙදි වැනි භාණ්ඩ ඒකක 212 ක් 20% ක් ලාභ ප්‍රතිශතයක් අන්තර්ගත කර වර්ග දෙකකට අයත් යෙදවුම් ප්‍රසම්පාදන එක් ඇස්තමේන්තුවකට ඇතුලත් කර ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු වෙත ඉදිකිරීම් වැඩ සහ භාණ්ඩ සැපයීමට ටෙන්ඩර් ලබා දී තිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළයුතු වේ. | ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදනය තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා සකස් කිරීම සහ මෙම කර්මාන්තයේ සේවා යෝජකයා ද (Employer) පළාත් පාලන දෙපාර්තමේන්තුවයි.කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කල මිල ගණන් අවම මිල ගණන් යැයි සිතා ප්‍රාදේශිය සභා ලේකම් තුමිය විසින් ඉදිරි කටයුතු කල බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| | 6.3.3 වගන්තිය | ප්‍රාදේශීය සභාවේ පුස්තකාල පළමු මහල ඉදි කිරීමේ ව්‍යාපෘතියේ ලංසු විවෘත කිරීමේ කමිටුවට අවම වශයෙන් ප්‍රසම්පාදන කමිටුව අනුමත කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවද මිල ගණන් විවෘත කිරීම පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මූල්‍ය නිලධාරියෙකු විසින් සිදුකර තිබුණි. | මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළයුතු වේ. | ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදනය තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා සකස් කිරීම සහ මෙම කර්මාන්තයේ සේවා යෝජකයා ද (Employer) පළාත් පාලන දෙපාර්තමේන්තුවයි.කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කල මිල ගණන් අවම මිල ගණන් යැයි සිතා ප්‍රාදේශිය සභා ලේකම් තුමිය විසින් ඉදිරි කටයුතු කල බව දන්වමි. |
| (vii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2045 සහ 2011 නොවැම්බර් 10 දිනැති ගැසට් නිවේදනය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සභාවට අයත් මාර්ගවල බොරළු, වැලි හා කළුගල් කියුබ් 12639.5 ප්‍රවාහනය වෙනුවෙන් රු.1,263,950 ක ගාස්තු අයකර ගැනිම සිදුකර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. නිවැරදි කර ගාස්තු අය කිරිමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.320,733 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,136,497 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,258,910 | 2,266,365 | 2,179,640 | 1,201,821 | 2,163,353 | 2,763,525 | 3,827,582 | 1,115,096 |
| (ii) | කුලී | 13,283,400 | 6,027,630 | 6,387,150 | 2,007,016 | 9,353,900 | 10,165,525 | 7,798,989 | 2,366,536 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 4,776,560 | 5,178,613 | 5,178,613 | 505,700 | 3,600,900 | 5,113,661 | 4,607,961 | 505,700 |
| (iv) | වෙනත් ආදායම් | 2,316,285 | 2,226,392 | 7,652,004 | 2,121,221 | 3,312,755 | 3,292,397 | 503,131 | 7,546,833 |
| | | 22,635,155 | 15,699,000 | 21,397,407 | 5,835,758 | 18,430,908 | 21,335,108 | 16,737,663 | 11,534,165 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,201,821 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | **පිළිගනිමි. මේ වන විට අදාළ ලේඛන සකස් කර හිඟ අය කිරීම සඳහා කටයුතුකරමින් සිටිමි.** |
| (ආ) 2005 වර්ෂයේ තක්සේරුව පදනම්ව සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අයකර තිබුණු අතර වසර 13 ක පරිච්ඡේදයේ නව ඉදිකිරීම්, සංශෝධන ආදිය මත වරිපනම් අය කිරිමට කටයුතු කර නොතිබුණු | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර වසර 05 කට වරක් දේපල තක්සේරු කර වරිපනම් බදු අයකල යුතු වේ. | පිළිගනිමි. 2019.04.05 දින පැවති මාසික මහ සභාව මඟින් නැවත දේපළ තක්සේරුකිරීම සඳහා සභා තීරණයක් ලබා දී ඇති අතර, ඒ අනුව කටයුතු කරමින් සිටිමි |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පුර නැගුම ව්‍යාපෘතිය යටතේ උතුරුමැද පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉදිකර 2017 ජුලි 20 දින සභාව වෙත ලබාදී තිබුණු කඩ කාමර 46 කින් කඩකාමර 40 ක් කුලී පදනම මත ලබාදී තිබුණු අතර අදාල කඩකාමර සඳහා විදුලිය ලබාදීම සඳහා සභාව කටයුතු කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ රු.7,015,000 ආදායමක් අහිමි වී තිබුණි. | කඩිනමින් විදුලි සම්බන්ධතාවය සහ අනෙකුත් යටිතල පහසුකම් ලබා දී ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට සුදුසු පරිසරය ගොඩනැගීම සභාව විසින් ඉටුකරදිය යුතු වේ. | පිළිගනිමි. විදුලිය ලබා නොදීම හේතුවෙන් කඩ විවෘත කිරීමට නොහැකි වී ඇත. මේ වන විට විදුලිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු කඩ කාමර 54 කින් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති කඩකුලී රු.1,041,843 ක්ද මස් හා මාළු කඩ අයවිය යුතු හිඟ බදු මුදල් රු.1,037,693 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩකාමර කුලී සහ එම බදු කඩිනමින් අයකර ගැනීමට හෝ අවශ්‍ය අවස්ථා වලදී නෛතික පියවර ගත යුතුය. | වෙළඳසංකීර්ණයේ කඩ කාමර 54 න් 2018 වර්ෂයට අය විය යුතු කඩ කුලී සියල්ල අය වී ඇති අතර වසර 05 කට වඩා පැරණි හිඟ ශේෂය වන රු.1042343 ක මුදල කපා හැරීමේ නියෝග සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

2.2.4 බලපත්‍ර ගාස්තු
---------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------- | ------------------- | ---------------------------- |
| (අ) | බලප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු පිළිබද සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකිරිමට කටයුතු කර නොතිබුණි. | වර්ෂය ආරම්භයේදි සමීක්ෂණ පවත්වා ගාස්තු අයකිරීමට පියවර ගත යුතු වේ. | දැන්වීම් පුවරු පිළිබද සමීක්ෂණයක් සිදුකර ඒ පිළිබද ලේඛනයක් සකස් කර ගාස්තු අය කිරීමට කඩිනමින් කටයුතු කරමි. |
| (ආ) | සභා බලප්‍රදේශයේ දුරකථන සේවා සම්ප්‍රේෂණ කුලුණු ප්‍රමාණය පිළිබද සමීක්ෂණයක් සිදුකර ඒවායින් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂය ආරම්භයේදි සමීක්ෂණ පවත්වා ගාස්තු අයකිරීමට පියවර ගත යුතු වේ. | සභා බල ප්‍රදේශය තුළ දුරකතන සම්ප්‍රේෂණ කුළුණු 18ක් ඇති බව හදුනාගෙන ඇති අතර ගාස්තු අය කර ගැනීම සඳහා කටයුතු මේ වන විට සුදානම් කර අදාල ආයතන දැනුවත් කර ඇත. |

2.2.5 වෙනත් ආදායම්
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------- | ------------- | -------------------------------- |
| 2017,2018 වර්ෂවලට අදාලව ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු ප්‍රමාණය ගණනය කර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුද්දර බදු ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. පළාත් භාණ්ඩාගාරය විසින් දැනුම දුන් පසු මුද්දර ගාස්තු ගණනය කිරීම සඳහා කටයුතු කරමි. |

03. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය ,පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබද කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම ,ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබදව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරිම සදහා 2018 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීම් කර ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක කිරිමට සභාව කටයුතු කල යුතු වේ. | පළාත් සභාව විසින් පනවා සම්මත කරගත් අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ පළ කිරීම සඳහා යවා ඇත. |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළයුතු වේ. | සියළුම ක්‍රියාකාරකම් ඉටු කරමින් පවති. |

(ඇ). කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,000,000 ප්‍රතිපාදන යටතේ අංක 77 තුලාන ළිඳවැව ප්‍රධාන මාර්ගය 2018 දෙසැම්බර් 15 දිනට ඉටුකර නොතිබුණු බැවින් ප්‍රතිපාදන කපාහැරීම නිසා සභා අරමුදලට රු.440,820 ක අලාභයක් සිදුවී තිබුණි. | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි නියමිත සහ ශිඝ්‍රසුම්ගත දිනට එම ව්‍යාපෘති නිමකර ගැනීමට සභාව කාර්යක්ෂමව ක්‍රියාකල යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අදාළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා අප වෙත රු.1,000,000 ක ප්‍රතිපාදන මුදලක ලබා දෙන බවට ලිඛිතව අපට දන්වා ඇත. නමුත් එම මුදල පසුව රු.500,000 දක්වා අඩු කොට අප වෙත ගෙවන බව අප වෙත දන්වා ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030ප්‍රකාරව ලඟාකරගත යුතු අරමුණු හා ඉලක්ක පිළිබද දැනුවත් වී නොතිබුණි. | 2030 තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට අදාල වන කාර්යය හා කර්තව්‍ය සභාව විසින් ඉටු කළයුතු වේ. | තිරසර සංවර්ධන න්‍යාය 2030 පිළිබද දැනුවත් වීමක් කර නොමැත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමේ තනතුරු 4 ක පුරප්පාඩු 07 ක්ද ද්විතියික මට්ටමේ තනතුරු 06 ක පුරප්පාඩු 07 ක් හා තනතුරු 02 ක අතිරික්තයක් වු අතර අනියම් සේවකයන් 10 දෙනෙකු බදවා ගෙන තිබුණි. | තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරගෙන මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිකර ගත යුතු වේ | සේවා අවශ්‍යතාවය මත අනියම් පදනමින් සේවකයින 10 දෙනෙකු පළාත් පාලන කොමසාරිස්තුමියගේ අනුමැතියට යටත්ව බදවා ගෙන ඇත. අතිරික්තව පවතින තනතුරු 02න් එක් තනතුරක් කාර්යාල කම්කරු තනතුරකි.එම තනතුර මේ වන විට කාර්යාලකාර්යය සහයක තනතුර ලෙස අන්තර්ග්‍රහණය කර ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1978 දෙසැම්බර් 19දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පවත්වාගෙන යායුතු ස්ථාවර වත්කම් ලේඛනයේ සභාවේ සතු වත්කම් වර්ග 18 ක් තක්සේරු කර ලේඛනගත කිරිමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යායුතුය. සභාව සතු සියළු වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කල යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන යන අතර එමවත්කම් තක්සේරු කර ලේඛන යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

### 3.4 අවිධිමත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ බල ප්‍රදේශයේ පමණක් ගවමස් විකිණීම සඳහා රු. 1,903,600 ක මුදලකට බදුදී තිබුණු සියඹලාගස්කඩ හා මුස්ලිම්හල්මිල්ලෑව පිහිටි ගව මස් කඩ 02 ක් වෙනුවෙන් භාවිතා කර තිබුණු ගව සතනාගාර 02 කින් සහා බල ප්‍රදේශයේ ගව මස්කඩ දෙක සඳහා ගවයන් 76 දෙනකු පමණක් ඝාතනය කර තිබුණු අතර කොළඹට මස් කිලෝග්‍රෑම් 105620 ක් ප්‍රවාහනය සඳහා ගවයන් 1234 දෙනකු සතනය කර තිබුණි. ඉතා අඩු ආර්ථිකමය වටිනාකමකට මිලදී ගෙන තිබුණු මෙම ගවමස් කඩ දෙකෙහි ටෙන්ඩරය උපයෝගී කර ගනිමින් අනවසර වෙළෙඳාමකට සභාව ඉඩදී තිබුණි. | වාර්ෂිකව බදු දුන් මස්කඩ සඳහා පවත්වාගෙන යන අදාල ගව ඝාතනාගාර වලින් වෙනත් මස් කඩ සහ බලප්‍රදේශයෙන් බැහැරට මස් ප්‍රවාහනය පිණිස ගවයන් ඝාතනය කරමින් සිදුකරන අනවසර වෙළඳාම සභාව විසින් නවතා දැමිය යුතු වේ. | මුස්ලිම්හල්මිල්ලෑව හා මහාසියඹලාගස්කඩ මස් කඩ එළගව මස්කඩ සඳහා සතුන් මැරීම පිණිස එම ගම්මාන දෙකෙහි ගව ඝාතකාගාර පරිහරය කිරීම සඳහා අවසර ලබා දී තිබුණි. |

### 3.5 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුස්තකාලය සඳහා වර්ග දෙකකට අයත් උපකරණ 210 ක් සැපයීමට වෙළඳපලේ විකුණුම් මිලෙන් 20% ක අතිරේක අධිලාභාන්තිකයක් සහිතව සහ ඇමතුම් පද්ධතියක් සවි කිරීම සඳහා රු.1,627,000 ක්වූ අධි ඇස්තමේන්තුවලට අදාලව මිලගණන් ඉදිරිපත් කිරීමේදි වර්ග දෙකකට අයත් උපකරණ 210 ක් සැපයීම් සඳහා මිල 20% සිට 40% දක්වා වැඩිකර ඇමතුම් පද්ධතිය සඳහා රු.450,000 ක් වූ 90% මිලගණන් අඩුවෙන් ඉදිරිපත් කර ගිවිසුම්ගතව රු.1,550,000 ක මිලට උපකරණ ඒකක 210 ක් පමණක් සපයා ඇමතුම් පද්ධතිය සවි නොකිරීම නිසා මුළුමනින් රු.1,060,833 ක මූල්‍යමය අලාභයක් අනාවරණය විය. | නොසැලකිලිමත්කම නිසා සිදුවී ඇති මූල්‍යමය අලාභය සම්බන්ධව වගකිව යුතු සියළු පාර්ශ්වයන්ගෙන් අලාභ අයකර ගත යුතු වේ. | ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කරනු ලැබුයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟිනි. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා සකස් කිරීම ද සිදු කරනු ලැබුයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් සහ මෙම කර්මාන්තයේ සේවා යෝජකයා ද (Employer) පළාත් පාලන දෙපාර්තමේන්තුවයි. . |

3.6 ප්‍රසම්පාදනය

---------------

ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ගැනීමට කටයුතු කරමි. |